රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 52

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01
25.11.2008

සියළුම අමාත්‍යංශ ලේකම්වරුන්
රාජ්‍ය ව්‍යාපාර සභාපතිවරුන් වෙත

**රාජ්‍ය ව්‍යවසායන්හි සේවකයින් විශ්‍රාම ගැන්වීමේ වයස**

අංක රාව්‍යාදෙ/44 හා 2007.07.31 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

කිසියම් පාර්ලිමේන්තු පනතකින් විශ්‍රාම ගැනීමේ වයස තීරණය වන රාජ්‍ය ව්‍යවසායන්හි හැර, අනිකුත් රාජ්‍ය ව්‍යවසායන්හි සේවකයින්ගේ වෛකල්පික විශ්‍රාම ගැනීමේ වයස අවුරුදු 55 විය යුතුය. එම සීමාවෙන් ඔබ්බට සේවකයින්ගේ සේවය ලබා ගන්නේ නම්, අදාළ සේවකයින්ගේ එකඟතාවය මත, එම සේවකයින්ගේ සේවා වාර්තා, චර්යා සටහන්, පැමිණීම, කාර්යක්ෂමතාවය සහ සෞඛ්‍ය තත්ත්වය ආදිය සළකා බලා වයස අවුරුදු 57 දක්වා සේවා දිගු ලබා දීමට අදාළ රාජ්‍ය ව්‍යවසායේ පාලක මණ්ඩලයට හැකිය. අතිවිශේෂ අවස්ථාවන්හිදී ආයතනය විධිමත්ව පවත්වාගෙන යාම සඳහා යම් සේවකයකුගේ සේවය අත්‍යවශ්‍ය බව පාලක මණ්ඩලය අදහස් කරන්නේ නම් පමණක් එම සේවකයාගේ සේවා කාලය අවුරුදු 57 න් ඔබ්බට අවුරුදු 60 දක්වා තවදුරටත් සේවා දිගු ලබා දීමට අදාළ රාජ්‍ය ව්‍යවසායේ පාලක මණ්ඩලයට ක්‍රියා කළහැකිය.

රාජ්‍ය ව්‍යවසායන්හි ඉහළ කළමණාකරණ ශ්‍රේණිවලට අයත් නිලධාරීන් විශ්‍රාම යැමේදී ඇතිවන පුරප්පාඩු පිරවීම සඳහා සුදුසු අනුප්‍රාප්තික සැලසුම් පිළියෙළ කිරීම පාලක මණ්ඩලයේ වගකීම වේ.

මේ පිළිබඳව යම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, ආචාර්ය බී.එම්.එස්.බටගොඩ - (දු.අ.2484617) හෝ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂිකා, අයි.ටී.කේ.ඉලංගමුදලි මහත්මිය (දු.අ.2484837) කරුණාකර අමතනු මැනවි.

එස්.අබේසිංහ
භාණ්ඩාගාරයේ ලේකම්

පිටපත්: (1) ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යංශය
(2) විගණකාධිපති
(3) ලේකම්, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව